# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම
## (සංස්ථාගත කිරීමේ)

**චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම**
**සඳහා ද වූ පනත් කෙටුම්පතකි.**

---

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා විසින්
2015 දෙසැම්බර් මස 19 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 16 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[57 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

එල්.ඩී.—ඕ. 21/2010.

## චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

"චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන භාරයක්, එකී සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව, ශ්‍රී ලංකාවේ යුද්ධයෙන් පීඩාවට පත් වූවන් සඳහා "චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම" යනුවෙන් නම් කරන ලද සමාජ සංවර්ධන පදනමක් පිහිටුවීමේ අරමුණ ඇතිව මෙතෙක් කල් කිලිනොච්චියේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී භාරයේ භාරකාර මණ්ඩලය, එකී භාරය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2015 අංක    දරන චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.*

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින්මතු "චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම — ශ්‍රී ලංකා සහන අරමුදල් භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මන්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එම නාමයෙන් සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:—

(අ) ආර්ථික සවිබල ගැන්වීම තුළින් අනාරක්ෂිත පවුල් සහ වෙනත් හැකියාවන් සහිත පුද්ගලයන්ගේ ජීවන මට්ටම ශක්තිමත් කිරීම සහ ඉහළ නැංවීම;

(ආ) ගෝලීයකරණයේ අභියෝගයන්ට මුහුණ දීමට හැකිවන පරිදි තරුණ තරුණියන් සහ ළමුන් අතර දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම පිණිස පුහුණු වැඩසටහන් තුළින් ක්‍රීඩා, සෞඛ්‍ය, අධ්‍යාපනය, සංගීතය, නැටුම්, චිත්‍ර, ත්‍රෛභාෂික සහ තාක්ෂණික සංවර්ධනය ඉහළ නැංවීම; සහ

(ඇ) සාමය ගොඩ නැංවීමේ ක්‍රියාකාරකම්වලට සහාය වීම සහ සමාජ සාධාරණත්වය සහතික කිරීම පිණිස සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම්වලට එරෙහි වීම යනාදිය වේ.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු 06 වැනි වගන්තිය යටතේ සාදන ලද ව්‍යවස්ථාවේ රීතිවලට අනුකූලව සභාපති, උප සභාපති හා සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරන ලද හෝ පත් කරනු ලබන එවැනි වෙනත් නිලධාරීන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් (මින්මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) පාලනය කරනු ලැබිය යුත්තේ ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය, මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී "චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම — ශ්‍රී ලංකා භාරය" සහන අරමුදලේ භාරකාර මණ්ඩලයේ සාමාජික නිල දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් ගරු සේවාවක නිරත විය යුතු අතර, වැටුප්, දීමනා, ප්‍රසාද දීමනා යනාදී වශයෙන් කිසිදු ගෙවීමක් හිමි නොවිය යුතු ය. එසේ නමුත්, තම රාජකාරී ඉටු කිරීමේ දී ඔවුන් විසින් දරන ලද යම් වියදමක් ඇතොත් ඒවා ප්‍රතිපූරණය කළ යුතු වේ.

(4) යම්කිසි පුද්ගලයකු,—

(අ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසිදු රටක බලාත්මක වෙනත් නීතියක් යටතේ ණය ගෙවීමට නොහැකි හෝ බංකොලොත් භාවයට පත් වූ කෙනකු ලෙස ප්‍රකාශ වී ඇත්නම්;

(ආ) විනය කටයුතු සම්බන්ධව යම් කිසි වරදකට වැරදිකරුවකු වී ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ බලාත්මක යම් කිසි නීතියක් යටතේ මානසික රෝගියකු ලෙස හෝ මානසික ආබාධයකට පත් වූ පුද්ගලයකු ලෙස ප්‍රකාශ වී ඇත්නම්;

(ඈ) මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව අවුරුද්දකට වැඩි කාලයක් අඛණ්ඩව ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින්නේ නම්; හෝ

(ඉ) අධ්‍යක්ෂවරයකු වශයෙන් ක්‍රියාත්මක වීම නොසලකා හරින්නේ නම් හෝ පැහැර හරින්නේ නම්,

මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කිරීමට හෝ තනතුරේ අඛණ්ඩව ක්‍රියා කිරීමට නුසුදුස්සකු වන්නේ ය.

**5.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන දෑ ඇතුළත්ව, සංස්ථාවේ පරමාර්ථ සියල්ල හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීමට හෝ කරගෙන යාමට අවශ්‍ය හෝ ආනුශංගික කුමන හෝ කටයුතු, කාරණා හා දේවල් කිරීම හෝ ඉටු කිරිමේ බලය සංස්ථාවට ඇත්තේ ය:— සංස්ථාවේ සාමාන්‍ය බලතල.

(අ) සංස්ථාවේ කාර්යයන් උදෙසා අවශ්‍ය වන යම්කිසි ඉඩමක් පවරා ගැනීම, දැරීම, මිලදී ගැනීම, බදු දීම හෝ බදු ගැනීම, උකස් කිරීම, විකිණීම හෝ හුවමාරු කිරීම, පැවරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට හෝ බලතල යොදා ගැනීමට අවශ්‍ය යම්කිසි ගිවිසුමක්, සම්මුතියක් සෘජුව හෝ සංස්ථාව විසින් ඒ වෙනුවෙන් බලය පවරන ලද යම්

කිසි නිලධාරියකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇති කර ගැනීම, ඉටු කිරීම;

(ඈ) මුදල් හෝ භාණ්ඩ ලෙස ප්‍රදානයන්, පරිත්‍යාග හා අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් භාර ගැනීම;

(ඇ) එයට අයත් මුදල් ආයෝජනය කිරීම හා යම්කිසි බැංකුවක ජංගම ගිණුම් හා ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාව සුදුසු යැයි අදහස් කරන යම් කිසි ක්‍රමයකට යම් කිසි ඇපයක් මත සංස්ථාවේ අරමුණු උදෙසා මුදල් ණයට ගැනීම සහ ආයෝජනය කිරීම; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය නිලධරයන්, සේවකයන් පත් කිරීම, සේවයේ යෙදවීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් පිළිබඳ විනය ක්‍රියා මාර්ග ගැනීම හා ඔවුන් සේවයෙන් පහ කිරීම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය;

(ඇ) සංස්ථාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම එහි බලතල, චර්යාව සහ කාර්යය;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය;

(ඉ) සංස්ථාවේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම පවත්වන වේලාවන්, ස්ථාන හා රැස්වීම පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය; සහ

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම හා එහි අරමුදල්වල භාරකාරත්වය.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන්ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාවේ අරමුදල.**

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තාවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, සම්මාදම්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් භාර ගනු ලබන සියලු මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකුවක හෝ බැංකු කීපයක සංස්ථාව නමින් වන ගිණුමක බැරට තැන්පත් කළ යුතු වන්නේ ය.

(2) මෙම පනත යටතේ වන සංස්ථාවේ කර්තව්‍ය, වගකීම් සහ එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉෂ්ට කිරීමේ දී හා භාවිතයේ දී සංස්ථාව විසින් දරා ඇති ඕනෑම වියහියදමක් අරමුදලින් පියවිය යුතු වන්නේ ය.

**සංස්ථාවේ ගිණුම් හා විගණනය.**

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැළැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් මණ්ඩලය තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්,—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක ඒක් එක් නේවාසික හවුල්කරුවකු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තීයේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

**සංස්ථාවේ මුද්‍රාව.**

**9.** සංස්ථාවේ මුද්‍රාව ලේකම් භාරයේ තිබිය යුතු අතර, සභාපති, ලේකම් සහ මණ්ඩලය විසින් නිසි පරිදි බලය පවරන ලද එවැනි වෙනත් තැනැත්තකුගේ ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද, සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටී බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිර විය යුතු ය.

**සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු ණය.**

**10.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වන දිනයට "චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම — ශ්‍රී ලංකා සහන අරමුදල්" භාරයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එම දිනයට චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම — ශ්‍රී ලංකා සහන අරමුදල් භාරයට ගෙවීමට ඇති සියලු ණය, සාමාජික මුදල්, සම්මාදම් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුත්තේ ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

සංස්ථාවේ මුදල් හා දේපල භාවිතය.

**12.** සංස්ථාවේ මුදල් හා දේපල කුමන හෝ ආකාරයකින් ලැබී තිබුණ ද, මෙහි සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ කාර්යය සඳහා පමණක් යෙදවිය යුතු අතර, එහි යම් කොටසක් හෝ යම් කිසි ලාභ හෝ ලාභාංශ ලෙස ඍජුව හෝ වක්‍රාකාරයෙන් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුත්තේ ය.

සංස්ථාව විසින් නිශ්චල සහ චංචල දේපල දැරිය හැකි බව.

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාවේ කාර්යයන් සඳහා සහ 06 වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ ඉතිරිවන දේපලක් ස්වකීය සාමාජිකයින් අතර, බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර සංස්ථාවේ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.